ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2024

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 12.2 ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

පටුන

			පිටු අංක
1.	1.1.	හැඳින්වීම	03
	1.2.	විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවුඩය	04
	1.3.	ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දැක්ම සහ මෙහෙවර	05
	1.4.	විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය	06
	1.5.	සංවිධාන සටහන	08
	1.6.	විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ	09
2.	2.1.	විභාග දෙපාර්තමේන්තුව විසින් ලබාගන්නා ලද විශේෂ ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග	10
	2.2.	විභාග දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්	12
3.	**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය**		
	3.1.	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	14
	3.3.	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	15
	3.4.	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	16
	3.5.	මූල්‍ය ප්‍රකාශ සටහන්	17
	3.6.	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	23
	3.7.	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	23
	3.8.	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	24
	3.9.	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	25
	3.10.	විගණකාධිපතිවරයාගේ වාර්තාව	26
4.	**කාර්ය සාධන දර්ශක**		
	4.1.	ආයතනයේ කාර්ය සාධන දර්ශක	40
5.	**තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය**		
	5.1.	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න	41
	5.2.	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	43
6.	**මානව සම්පත් පැතිකඩ**		
	6.1.	සේවක සංඛ්‍යා කළමනාකරණය	44
	6.2.	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න	44
	6.3.	මානව සම්පත් සංවර්ධනය	45
7.	**අනුකූලතා වාර්තාව**		47

හැඳින්වීම

රටක ආර්ථික, සංස්කෘතික හා තාක්ෂණික සංවර්ධනය උදෙසා මෙන්ම එක් එක් පුද්ගලයාගේ මනෝභාව, දැනුම සහ කුසලතා වර්ධනය කර ගැනීම උදෙසා ද අධ්‍යාපනය මගින් සිදුවන කාර්යභාරය අතිමහත් වන අතර, මේ සඳහා ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හැඳින්විය හැකිය.

1951 වර්ෂයේ සිට දශක කිහිපයකට ආසන්න කාලයක් තිස්සේ අධ්‍යාපන පද්ධතියේ මූලික සාධකයක් වශයෙන් කටයුතු කරන මෙම දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ විභාග ක්‍රියාවලිය මුළුමනින් ම නියාමනය කරනු ලබයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඔස්සේ යාවත්කාලීන වෙමින් ප්‍රශ්න පත්‍රවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමත්, තාක්ෂණික ප්‍රවණතා අනුගමනය කරමින් විභාග පද්ධතිය හැඩගැස්වීමත් මෙහි ප්‍රධාන අභිප්‍රාය වේ.

අධ්‍යාපන නවීකරණයන්ට ගැළපෙන ලෙස ජාතික විභාගයන් පැවැත්වීමට මෙන්ම, නවීන තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ විභාග ප්‍රතිඵල ලබාදීම, සහතික පත්‍ර නිකුත් කිරීම ඇතුළු කාර්යක්ෂම සේවාවක් සැපයීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත. එමෙන්ම විශ්වසනීයත්වය, සාධාරණත්වය සහ සාමූහිකත්වය අරමුණු කරගත් විභාග ක්‍රියාවලිය තුළින් නිරවද්‍යතාවයෙන් යුතුව සිසු හැකියාවන් ඇගයීමට හා තක්සේරුකරණයට හැකිවීම ද ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාවක් ලෙස විභාග දෙපාර්තමේන්තුව සතු සුවිශේෂී ලක්ෂණයකි.

මෙම වාර්තාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය තුළ සිදුකරන ලද කාර්යභාරය පසුවිපරම් කරමින් එහි ප්‍රගතිය ඉදිරිපත් කිරීම උදෙසා සම්පාදනය කර ඇති බව හැඳින්විය හැක.

විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

රටේ දරු පරපුර දැනුමින්, හැකියාවෙන්, ආචාර ධර්මවලින් මෙන්ම බුද්ධියෙන් පිරිපුන් ජාතියක් බවට පත්කිරීමේ මූලික අඩිතාලම අධ්‍යාපනයයි. මෙය සරල දැනුමක් ලබාදීම පමණක් නොව, සිසු දරු දැරියන්ගේ මානසික, සමාජීය, නෛතික හා වෘත්තීය හැකියාවන් වර්ධනය කරමින්, යහපත් පුරවැසියන් වශයෙන් සමාජයට දායාද කිරීමේ අතිවිශාල කාර්යභාරයකි. මෙම අධ්‍යාපන පද්ධතිය තුළ විශේෂ ස්ථානයක් හිමිවන ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හැඳින්විය හැකිය.

රාජ්‍ය සේවයේ කටයුතු ඩිජිටල්කරණය කිරීම සඳහා පිඹුරුපත් සකසමින් සිටින මොහොතක ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය ද ඒ හා සමගාමීව ඩිජිටල්කරණය කිරීම සඳහා පියවර ගැනීම තුළින් අප විසින් පසු කරන්නට යෙදුනු දුෂ්කර හා වඩාත් තීරණාත්මක කාල පරිච්ඡේදයක් සඳහා අභියෝගාත්මකව මුහුණ දෙමින් වඩාත් සාර්ථක හා ප්‍රශස්ත ඇගයුම් හා තක්සේරුකරණ ක්‍රියාවලියක යෙදීමට අපට හැකියාව ලද බව සඳහන් කළ හැක.

දැයේ සිසු දරුවන්ගේ අධ්‍යාපනයේ තීරණාත්මක කඩඉම් සාර්ථකව පසු කිරීම උදෙසා වඩාත් විශ්වසනීය හා ඉහළ ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනුමක් සහිතව දරුවන්ගේ දක්ෂතා තක්සේරු කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිරතුරුවම ක්‍රියා කරමින් සිටී.

වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්ති හා අනුගත වෙමින් ජනතා අභිලාෂයන් මුදුන් පමුණුවාලීම උදෙසා ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් හා ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ඇප කැප වී සිටී.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

දැක්ම

ඇගයීම් ක්‍රමවේද සහ භාවිත විශිෂ්ට ලෙස යොදා ගනිමින් ද,
වෙනත් විවිධ පරීක්ෂණ කාර්යයන් හැසිරවීම තුළින් ද,
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා
නායකත්වය සැපයීම

මෙහෙවර

ජාතික අවශ්‍යතාවලට ගැළපෙන සේ විශ්වසනීයතාව හා වලංගුතාව
ආරක්ෂා වන පරිදි සකස් කරනු ලබන
ඇගයීම් උපකරණ හා ක්‍රම ශිල්ප මඟින්
අධ්‍යාපනික සාධනය හා සහතිකකරණය පිළිබඳ ක්‍රියාකාරකම්
විශිෂ්ටත්වය කරා මෙහෙයවීම

විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත මගින් 1951 වර්ෂයේ දී පිහිටුවන ලද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ප්‍රසිද්ධ විභාග පැවැත්වීම සම්බන්ධව නෛතික බලතල සහිත එකම ආයතනය වේ. මෙහි කාර්යභාරයන් පහත පරිදි වේ.

01. ඇගයීම් හා පරීක්ෂණ කාර්යය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන අතර, වර්තමානය වන විට වර්ෂයකට විභාග 300කට අධික ප්‍රමාණයක් පැවැත්වීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත.

02. අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ), 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය යනාදී පාසල් විභාග සඳහා සැලසුම් සකස් කිරීම, ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය තීරණය කිරීම හා සැකසීම, විභාග සංවිධානය කිරීම හා පැවැත්වීම, ඇගයීම් කටයුතු සිදු කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.

03. රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම්, වාචික පරීක්ෂණ යනාදී වෙනත් විභාගයන් ද මෙම දෙපාර්තමේන්තුව මගින් පැවැත්වේ. එම විභාගයන්හි ස්වභාවය අනුව ප්‍රශ්න පත්‍රවල ව්‍යුහය තීරණය කිරීම හා සැකසීම, විභාග සංවිධානය කිරීම හා පැවැත්වීම, ඇගයීම් කටයුතු සිදු කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම මෙමඟින් සිදුවේ.

04. තවද, දේශීය හා විදේශීය අවශ්‍යතා සඳහා,
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය
- අ.පො.ස. (උසස් පෙළ) විභාගය
- සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය
- බෞද්ධ ධර්මාචාර්ය විභාගය
- මූලික පිරිවෙන් අවසාන විභාගය
- කතෝලික ධර්මාචාර්ය විභාගය
- අල්-අලීම් විභාග
- ඉස්ලාම් දීනියාත් විභාග
- ජාතික නැටුම් සංගීත විභාගය
- කාර්මික විද්‍යාල විභාග
- ගුරු විද්‍යාල අවසාන විභාගය ආදී විභාගවල ප්‍රතිඵල සනාථ කිරීම, විභාග සහතිකපත්‍ර නිකුත් කිරීම, නාම සංශෝධන සිදු කිරීම මෙන්ම දහම් පාසල් අවසාන විභාගයේ ප්‍රතිඵල ඒකාබද්ධ කිරීම, සනාථ කිරීම, සහතික පත්‍ර නිකුත් කිරීම සහ මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.


05. සේවාලාභීන් සඳහා විභාග සහතික පත්‍ර නිකුත් කිරීම එක්දින සේවා ක්‍රමය හා සාමාන්‍ය සේවා ක්‍රමය යටතේ සිදු කරනු ලබන අතර, මේ වන විට මාර්ගගත (Online) ක්‍රමය හා විද්‍යුත් තැපැල් (e-mail) මගින් සහතික නිකුත් කිරීම දක්වා මෙම කාර්යය ප්‍රවර්ධනය වී ඇත.

06. දැයේ දුවා දරුවන්ට ගුණාත්මක තත්ත්වයෙන් හා නිරවද්‍යතාවයෙන් යුත් විභාග ප්‍රශ්න පත්‍ර සහ ලකුණු දීමේ පටිපාටි ඇතුළත් ප්‍රශ්නෝත්තර පොත් නිකුත් කිරීම සඳහා පෞද්ගලික පොත් ප්‍රකාශන ආයතන වෙත අවසර ලබාදීම ද විභාග දෙපාර්තමේන්තුවේ තවත් කාර්යභාරයකි. මෙහිදී අදාළ පොත් ප්‍රකාශන ආයතන ලියාපදිංචි කිරීම සහ ප්‍රශ්නෝත්තර පොත් වෙළඳපොලට නිකුත් කිරීමට අවසර ලබාදීම මෙන්ම අදාළ සමාගම් වෙත පනවන ලද නීතිවලට එරෙහිව ක්‍රියාත්මක වන්නන් පිළිබඳ දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද පියවර ගැනීම සිදු කරයි.

07. තෝරාගත් විදේශීය විභාග, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගවලට සමාන කිරීම ද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන තවත් සුවිශේෂී කාර්යයකි. අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉතා නිවැරදි ව පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම සමාන කිරීම් සිදු කරනු ලබයි.

08. විභාග පැවැත්වීමේදී වැඩිවෙමින් පවතින විභාග අක්‍රමිකතා අවම කර, වඩාත් සාධාරණ හා විශ්වසනීය ලෙස විභාග පැවැත්වීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණකි. මේ සඳහා විභාග අපේක්ෂකයන් මෙන්ම විභාග කාර්ය මණ්ඩලය අතින් ද සිදුවන සියලු අක්‍රමිකතා නිවැරදිව විමර්ශනය කොට වරදේ ස්වභාවය අනුව ඊට අදාළ පියවර ගැනීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සියලුම අභියෝගවලට සාර්ථකව මුහුණ දෙමින් පාසල් විභාග, බඳවා ගැනීම් හා අනෙකුත් විභාග කඩිනමින් පැවැත්වීමට කටයුතු කරන අතර, මෙම සියලුම කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒකාබද්ධව විශ්වසනීයතාව හා රහසිගතභාවය අනිශයින් ආරක්ෂා කර ගනිමින් සාධාරණ හා වලංගු විභාගයන් පැවැත්වීමේ ජාතික මෙහෙවරක සාර්ථකව නිරත වී සිටියි.



SETS	School Evaluation & Testing service	**Pac.**	Packing
IETS	Institution Evaluation & Testing service	**Dis.**	Dispatch
ADDITIONAL COM.GENERAL	Additional Commissioner General	**Ev.**	Evaluation
COMM of EX.	Commissioner of Examinations	**SBA**	School Based Assessment
Sch. Org. & Res.	School Organization & Result	**IB**	Item Bank
Org. Con. Ev. & Res.	Organization Confidential Evaluation & Result	**Inv.**	Investigation
R & D	Research and Development	**Fin.**	Finance
DCX	Deputy Commissioner of Examinations	**Cer.**	Certificate
ACX	Assistant Commissioner of Examinations	**Sup.**	Supply
AO	Administrative Officer	**Tec.**	Technology
ICT Off.	ICT Officer	**Plan.**	Planning
Org.	Organization	**Con.**	Confidential
D (ICT)	Director (ICT)	**Pre.**	Press
DD (ICT)	Deputy Director (ICT)	**Res.**	Result
AD (ICT)	Assistant Director (ICT)		


විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ශාඛාවන්

- පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
- රහස්‍ය (පාසල් විභාග) ශාඛාව
- ඇගයීම් (පාසල් විභාග) ශාඛාව
- විමර්ශන ශාඛාව
- සහතික පත්‍ර ශාඛාව
- පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
- තක්සේරුකරණ හා ඇගයීම් ප්‍රතිසංස්කරණ ශාඛාව
- සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව
- රහස්‍ය (ආයතනික විභාග) ශාඛාව
- ඇගයීම් (ආයතනික විභාග) ශාඛාව
- ප්‍රතිඵල ශාඛාව
- ආයතන ශාඛාව
- තැපැල් ශාඛාව
- ගිණුම් ශාඛාව
- සැපයීම් ශාඛාව
- ගබඩා කළමනාකරණ හා තොග පාලන ශාඛාව
- මුද්‍රණාලය
    - මුද්‍රණාලය (රහස්‍ය)
    - මුද්‍රණාලය (රහස්‍ය නොවන)
- පරිගණක ශාඛාව
- දත්ත සටහන් ශාඛාව
- මාර්ගගත ඒකකය
- සැලසුම් ක්‍රියාත්මක කිරීමේ හා නියාමන ශාඛාව

විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විභාග දෙපාර්තමේන්තුව විසින් ලබාගන්නා ලද විශේෂ ජයග්‍රහණ හා මුහුණ දුන් අභියෝග

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නව සය මහල් බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නිම කර එය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම.



- දෙපාර්තමේන්තුවේ සේවයෙහි නියුතු නිලධාරීන් විවිධ ක්ෂේත්‍රයන් හි නිපුණත්වය වර්ධනය කර ගැනීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්වලට යොමු කරන ලද අතර, එමගින් දෙපාර්තමේන්තුවේ ඉලක්කගත කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කර ගැනීමට හැකියාව ලැබීම.



- 2025 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රු. මිලියන 1,089.2 ක් වටිනා ව්‍යාපෘති යෝජනා අනුමත කරවා ගැනීම.

- විදේශ සහතිකපත්‍ර ලබා ගැනීමේදී විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත නොගොස් විද්‍යුත් තැපෑල (e-mail) ඔස්සේ විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සහතික කරන ලද සහතික පත්‍රවල මෘදු පිටපතක් (Soft Copy) ලබා ගැනීමට හැකිවන පරිදි මාර්ගගත පද්ධතිය වැඩිදියුණු කිරීම.

- විභාග ප්‍රතිඵල සනාථ කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම.

- නැවත සමීක්ෂණ මණ්ඩලවල සිදුවන වෙනස්කම් යාවත්කාලීන කිරීම ඇතුළු කටයුතු සඳහා නව මාර්ගගත පද්ධතියක් හඳුන්වා දීම. මෙමගින්, නැවත සමීක්ෂණ මණ්ඩල හා සම්බන්ධ සියලු කටයුතු වඩාත් නිරවද්‍යවීමත්, කාර්යක්ෂමවීමත් සිදුවිය.

- දෙපාර්තමේන්තුවේ ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලිය නවීන හා වැඩිදියුණු කිරීමේ අරමුණින් ඇගයීම් ප්‍රතිසංස්කරණ හා තක්සේරුකරණ ශාඛාවක් පිහිටුවීම.

- ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් දහම් පාසල් අවසාන විභාගවල (බෞද්ධ, හින්දු, මුස්ලිම් හා කතෝලික) සහතිකපත්‍ර නිකුත් කිරීමට කටයුතු කිරීම මගින් දේශීය මෙන්ම විදේශීය භාවිතය සඳහා ද එම සහතිකපත්‍ර යොදා ගැනීමට හැකියාව ලැබීම.

- බඳවා ගැනීම්, උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග යනාදී සියලුම ආයතනික විභාගවල ප්‍රවේශ පත්‍ර මාර්ගගත ක්‍රමය ඔස්සේ බාගත කිරීමේ පහසුකම් සැලසීම තුළින් ප්‍රවේශ පත්‍ර නොලද අයදුම්කරුවන්ට දෙපාර්තමේන්තුවට පැමිණීමකින් තොරව තම ප්‍රවේශ පත්‍රය ලබා ගත හැකිවීම.

- පෙර වර්ෂයන්ට සාපේක්ෂව දෙපාර්තමේන්තු වෙබ් අඩවියට උඩුගත කර ඇති පසුගිය ආයතනික විභාග ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව වැඩිකිරීම හේතුවෙන් අයදුම්කරුවන්ට දෙපාර්තමේන්තුවට පැමිණීමකින් තොරව ඒවා බාගත කරගැනීමට හැකියාව ලැබීම සහ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර වැඩි ප්‍රමාණයක් පරිශීලනයට අවස්ථාව ලැබීම.

- මෙතෙක් පැවති තැපෑල මගින් අයදුම්පත් යොමු කිරීමේ ක්‍රමවේදය වෙනුවට 90% පමණ විභාගයන් මාර්ගගත ක්‍රමයට අයදුම් කිරීමට සැලසීම තුළින් අයදුම්පත් ප්‍රමාදයකින් තොරව නියමිත දිනට ලැබීමත්, අයදුම්පත්‍ර සඳහා වැය වන කඩදාසි භාවිතය අවම වීමත් සිදුවීම.

- ප්‍රසම්පාදන ක්‍රියාවලිය වේගවත් හා වඩාත් පහසු කිරීමේ අරමුණින් ඊ-ප්‍රසම්පාදන (e-procurement) ක්‍රමවේදය ආරම්භ කිරීමේ මූලික පියවර තැබීම.

විභාග දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්

- මාණ්ඩලික නිලධාරීන් සඳහා කළමනාකරණ කුසලතා සහ තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධන වැඩසටහන්.

- සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා MS Office, Payroll , CIGAS, ITMIS පද්ධති සම්බන්ධ පුහුණු වැඩසටහන්, නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ පුහුණු, විභාග වංචා, අක්‍රමිකතාවලට අදාළව විධිමත් විමර්ශන පැවැත්වීම සම්බන්ධ පුහුණු වැඩසටහන්.

- අර්ධ ස්වයංක්‍රීය පරීක්ෂණ උත්පාදන පද්ධතිය (SATGS), පාසල් මට්ටමේ තක්සේරුකරණ සම්පත් සංචිතය (SLARR) සහ ශිෂ්‍ය තක්සේරුකරණ කළමනාකරණ තොරතුරු පද්ධතිය (SAMIS) යන ආධාරක පද්ධති තුනක් සංවර්ධනය කිරීම. (දැනට ක්‍රියාත්මක වෙමින් පවතී)

- DLI-1 යටතේ සියලුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ සහ භාණ්ඩ සමගින් අලුතින් පිහිටුවන ලද ‘‘තක්සේරුකරණ හා ඇගයීම් ප්‍රතිසංස්කරණ ශාඛාව’’ සවිබල ගැන්වීම.

- අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජාතික තක්සේරුකරණ රාමුව , ජාතික විෂයමාලා රාමුව (NCF) හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF) යාවත්කාලීන කිරීම.

- පාසල් මට්ටමේ තක්සේරුකරණ පිළිබඳ පර්යේෂණ සිදු කිරීම හා එම පර්යේෂණ මත පදනම්ව පවතින හා යෝජිත පාසල් පාදක තක්සේරුකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා තක්සේරුකරණය හා ඇගයීමට අදාළ උසස් අධ්‍යාපන අවස්ථා සහ පුහුණු (දේශීය, විදේශීය, දිගු කාලීන හා කෙටි කාලීන) ලබා දීම.

- නව තක්සේරුකරණ වැඩපිළිවෙල පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ අදාළ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- අධ්‍යාපනික ඇගයීම් ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම.

- අ.පො.ස.(සා/පෙළ) විභාගය සඳහා මිණුම් සලකුණු අධ්‍යයනය කිරීම. (Bench marking studies)

- ආයතනික විභාග සම්බන්ධ අයිතම සංචිතයට අයිතම සකස් කරන සම්පත්දායක නිලධාරීන් සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය සඳහා ද්වී වර්ණ මුද්‍රණ යන්ත්‍රයක් (Two Color Printing Machine) මිල දී ගැනීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව සතු පැරණි, දිරාපත් වෙමින් පවතින සහ මෙතෙක් පරිගණකගත නොවූ විභාග ප්‍රතිඵල ලේඛනවල ඇති දත්ත සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ දෙවැනි අදියර ආරම්භ කිරීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සහ දෙපාර්තමේන්තුවෙන් සේවා ලබා ගැනීමට පැමිණෙන මහජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා දෙපාර්තමේන්තුවේ සනීපාරක්ෂක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.

- විභාග ක්‍රියාවලිය සහ සහතික පත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

- විභාග මෙහෙයුම් ක්‍රියාවලිය බාධාවකින් තොරව ඉටු කිරීම සහතික කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව සඳහා 1000KVA ක ජනක යන්ත්‍රයක් ස්ථාපනය කිරීම.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පරිශ්‍රය ප්‍රතිසංස්කරණය කිරීම.

- විභාග දත්තවල අඛණ්ඩතාව හා රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ක්‍රියාවලිය හා සහතිකපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාළ ප්‍රධාන පරිගණක පද්ධතිය වන AS 400 පරිගණක පද්ධතිය නඩත්තු හා සේවා කිරීම නවීකරණය.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

එසිඒ-එප්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	තත්‍ය 2023 රු.	
-	ආදායම් ලැබීම්		184,822,080	217,794,625	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
180,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	184,822,080	217,794,625	
180,000,000	මුළු ආදායම් ලැබීම් (අ)		184,822,080	217,794,625	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
10,994,591,000	භාණ්ඩාගාර අග්‍රිම		6,901,309,000	5,800,599,000	එසිඒ-3
-	තැන්පතු		162,134,551	291,528,670	එසිඒ-4
22,000,000	අත්තිකාරම් ගිණුම්		34,804,993	36,655,460	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
11,016,591,000	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		7,098,248,544	6,128,783,130	
11,196,591,000	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		7,283,070,623	6,346,577,756	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		55,491,999	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		7,227,578,625	6,346,577,756	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
652,720,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	547,924,107	467,712,838	
10,375,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	6,813,655,325	5,999,337,464	එසිඒ-2(ii)
5,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	4,024,898	4,129,599	
-	පොළී ගෙවීම්	8	-	0	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	13,235	
11,033,220,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		7,365,604,329	6,471,193,136	
	මූලධන වියදම්				
58,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	50,400,958	10,276,785	
246,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	228,001,620	92,063,272	
	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිඒ-2(ii)
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	995,145	863,460	
15,000,000	වෙනත් මූලධන වියදම්	15	-	-	
320,500,000	මුළු මූලධන වියදම් (උ)		279,397,723	103,203,517	
	තැන්පතු ගෙවීම්		235,303,503	7,336,636	එසිඒ-4
17,000,000	අත්තිකාරම් ගෙවීම්		26,975,351	34,806,314	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
17,000,000	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		262,278,854	42,142,950	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		7,907,280,907	6,616,539,603	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(679,702,282)	(269,961,848)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(679,702,282)	(269,961,848)	එසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එසිඒ-3
			-	-	

Page 1

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
		තක්ෂ	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	3,936,230,545	3,702,528,925
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	69,305,438	77,135,080
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	0	0
මුළු වත්කම්		**4,005,535,983**	**3,779,664,005**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(160,343,495)	(225,682,806)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,936,230,545	3,702,528,925
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	229,648,933	302,817,886
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	0	0
මුළු වගකීම්		**4,005,535,983**	**3,779,664,005**

පිටු අංක ....07....සිට ....29.... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇඟිණුම් පිටු අංක ...30.... සිට ....40.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම් පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි යඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	එච්.ජේ.එකිසි. අමින් ජයසුන්දර	අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
තනතුර	විභාග කොමිසාරිස්	නම : ඩබ්.ආර්. දමයන්ති
දිනය : 2025/02/27	ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව	දිනය : 2025/02/27 කොමිසාරිස් (මුදල්)
නාලක කලුවැව	පැලඳෙන්න, බත්තරමුල්ල	ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ලේකම්		පැලවත්ත, බත්තරමුල්ල
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය		

Page 2

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තනය	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	171,518,329	210,133,022
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	519,794,504	296,561,717
අග්‍රිම ලැබීම්	6,901,309,000	5,800,599,000
අත්තිකාරම් අයකර ගැනීම්	36,460,967	43,621,532
තැන්පතු ලැබීම්	162,134,551	291,528,670
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**7,791,217,350**	**6,642,443,941**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	7,121,191,043	6,283,994,200
සහනාධාර සහ මාරුකිරීම්	4,024,898	4,129,599
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	68,291,093	209,208,902
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	55,491,999	-
අත්තිකාරම් ගෙවීම්	27,517,092	34,571,087
තැන්පතු ගෙවීම්	235,303,503	7,336,636
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**7,511,819,627**	**6,539,240,424**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**279,397,723**	**103,203,517**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
ගිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	279,397,723	103,203,517
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**279,397,723**	**103,203,517**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(279,397,723)**	**(103,203,517)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)		-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

Page 3

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

ඇමුණුම - (i)

වියදම් ශීර්ෂ අංකය :212
වැඩසටහන් අංකය හා නාමය :

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :විභාග දෙපාර්තමේන්තුව

(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම /කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව		-	-

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
3		
4		
එකතුව	-	-

(ii) නවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

	අගය		සිද්ධි සංඛ්‍යාව	මුළු එකතුව (රු)
රු	25,000.00	අඩු		
රු	25,000.01	වැඩි		
	එකතුව		-	-

අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය	සිද්ධි සංඛ්‍යාව	අගය (රු)
1		
2		
3		
4		
එකතුව	-	-

(ii) අනුව කාල විශ්ලේෂණය

වසර 5 ට අඩු	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 5-10	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු
වසර 10 ට වැඩි	සිද්ධි සංඛ්‍යාව	
	ගණන	රු

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු .රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය .

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2025/09/22

ඩී.ජී.ආර්. දිලයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

ඇමුණුම -(ii)

පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 2 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :විභාග දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය හා නාමය :

1 වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

	අගය	සිද්ධි සංඛ්‍යාව	වටිනාකම (රු)
(i)	රු. 25,000.00 අඩු	.....	....
(ii)	රු. 25,000.01 වැඩි	.....	.....,.....
එකතුව		-	-

2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා දයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

අලාභයේ ස්වභාවය	ආරම්භක කපා නොහල ශේෂය රු.	අලාභයේ වටිනාකම රු.	අයකර ගැනීම් රු.	පොතෙන් කපා හල අගය රු.	කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු.	පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය
1						
2						
3	-	-	-	-	-	-
4						
5						
6						
එකතුව						

සටහන - සටහන (i) හි ඇතුළත් ගිණුම්ගත කළ යුතු පාඩු හා අත්හැරීම් හැර මූ .රෙ. 109 යටතේ වන අනෙකුත් පාඩු හා අත්හැරීම් පමණක් මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය .

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2024/04/25

ඩබ්.පී.ආර්. දමයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
නැඟෙනහිර බත්තරමුල්ල

* තම වාර්තාකරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව කොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය .

බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම:විභාග දෙපාර්තමේන්තුව
වියදම් ශීර්ෂ අංකය:212
වැඩසටහන් අංකය හා නාමය:

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළ පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු								
කඩුවෙල මහනගර සභාව		1	0	1409-140	11	97,500		97,500
තැපැල් දෙපාර්තමේන්තුව		2	0	1402	11	80,000		80,000
එකතුව								177,500
2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල								
ලංකා විදුලි බල මණ්ඩලය		1	0	1403	11	6,538		6,538
ලංකා විදුලි බල මණ්ඩලය		1	0	1403	11	5,220,116		5,220,116
ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය		1	0	1409-140	11	200,549		200,549
රක්නා ආරක්ෂණ ලංකා ලිමිටඩ්		1	0	1407	11	661,042		661,042
එකතුව								6,088,245
3. වෙනත් (පෞද්ගලික අංශය)								
L.G.P.S වාමර		1	0	1409-140	11	42,560		42,560
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	19,378		19,378
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	70,191		70,191
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	7,090		7,090
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	91,433		91,433

ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	20,490		20,490
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	6,531		6,531
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	10,332		10,332
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	355		355
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	784		784
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	4,142		4,142
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	5,926		5,926
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	91,810		91,810
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී		1	0	1402	11	3,093		3,093
ඉමාඩියේට් ප්‍රාදේශීය සමාගම		1	0	1402	11	107,596		107,596
එකතුව								481,711
මූල එකතුව								6,747,456

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2025 මාර්තු 25

ඕ.පී.ආර්. දමයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විහාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

ඇමුණුම - (vii)

අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේනම:විභාග දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය: 212

වැඩසටහන් අංකය හා නාමය:

දිනය	වවුචර් අංකය	ආදායකයාගේ නම	ගෙවීමේ ස්වභාවය	ගණන (රු)
		අස්ථානගත වවුචර කිසිවක් නැත		

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2025/02/25

ඩී.පී.ආර්. දමයන්ති
කොමසාරිස් (මූදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

* නම් වාර්ෂානුරණ ආයතනයේ මෙම වාර්තාවලට අදාළව කොරතුරු නොමැති අවස්ථාවල හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

ඇමුණුම - (viii)

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2024.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම ශීර්ෂ අංකය:212 දෙපාර්තමේන්තුවේ නම :විභාග දෙපාර්තමේන්තුව

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2024.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2024.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	ලංකා බැංකුව	7041225	577,517,306	0	නැත	දෙසැම්බර්
2	ලංකා බැංකුව	7041227	209,508	0	නැත	දෙසැම්බර්
3	ලංකා බැංකුව	7041228	0	0	නැත	දෙසැම්බර්
4	ලංකා බැංකුව	7041229	1,217	0	නැත	දෙසැම්බර්
5	මහජන බැංකුව	208-1001-6902-6223	90,455,649	0	නැත	දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි .

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මූදල්) /කොමසාරිස් (මූදල්)
දිනය : 2025/02/25

ඕ.පී.ආර්. දම්මයන්ති
කොමසාරිස් (මුදල්)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත බත්තරමුල්ල

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.02.13	විභාග හා අනෙකුත් ගාස්තු	180,000,000/-	180,000,000/-	184,822,080/-	102%

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	11,180,000,000/-	11,033,220,000/-	7,365,604,329/-	66.75%
ප්‍රාග්ධන	140,000,000/-	320,500,000/-	279,397,723/-	87.17%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගිතා ප්‍රගතිය
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
01.	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව	ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් හා උසස් කිරීමේ විභාග සඳහා	6,494,455.11	-	6,494,455.11	100%
02.	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ඉංජිනේරු සහකාර සේවයේ ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය සඳහා	1,653,134.75	-	1,653,134.75	100%
03.	රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	බඳවා ගැනීම්, උසස් කිරීම් හා කාර්යක්ෂමතා කඩඉමි විභාග සඳහා	54,560,120.05	-	51,745,302.08	94.84%
04.	අධ්‍යාපන අමාත්‍යාංශය	සැසිප් - DLI ක්‍රියාකාරකම්වලට අදාළ කාර්යයන් ඉටු කිරීම	81,500,000.00	-	3,610,595.85	4.43%
05.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	මරණ පාරිතෝෂික ගෙවීම	1,653,134.75	-	1,653,134.75	100%

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	2,052,189,258.67		
9152	යන්ත්‍රෝපකරණ	-	973,067,746.78		
9153	ඉඩම්	-	635,700,000.00		
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-		
9160	කෙරීගෙන යන වැඩ	-	275,273,539.91		
9180	බදු දෙන ලද වත්කම්	-	-		

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. EDU/B/DE/FA/01/24 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 27 දින

ගණන්දීමේ නිලධාරී,
විභාග දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විභාග දෙපාර්තමේන්තුවේ, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම: උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව විභාග දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව විභාග දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 තැන්පතු ගෙවීම්

මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 02 කට වැඩි ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුව ද 2024 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්ම වී ඇති රු. 100,000 ක් වූ ටෙන්ඩර් තැන්පතු, පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.

1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අග්‍රිම ගිණුම් අංක7002-0-0-055-0-24-0 හි භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව 2024 වර්ෂයේ වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම්වල එකතුව රු.626,530,588 ක් වුවද දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය (ඒසිඒ - 3) අනුව එම අගය රු. 55,491,999 ක් වූයෙන් ඒ අතර රු. 571,038,589 ක වෙනසක් පැවතුණි.

(ආ) අග්‍රිම ගිණුම් අංක7002-0-0-055-0-24-0 හි භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව 2024 වර්ෂයේ වෙනත් මූලාශ්‍ර ලැබීම් හා භාණ්ඩාගාර ලැබීම් වලින් කරන ලද වියදමේ එකතුව රු. 7,472,347,593 ක් වුවද දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය (ඒසිඒ- 3) අනුව එම අගය රු. 6,901,309,000 ක් වූයෙන් ඒ අතර රු. 571,038,593 ක වෙනසක් පැවතුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු.630,000,000 ක් ලෙස තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය තුල ඇතුලත් කර තිබුණු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි හෙක්ටයාර් 1.3596 ක් විශාල ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) මහවැලි අධිකාරිය විසින් 2021 අප්‍රේල් 24 දින විභාග දෙපාර්තමේන්තුවට පවරා දෙන ලද කොත්මලේ කොට්ඨාශයට අයත් රිවර්සයිඩ් වතු බංගලාව සහ තවත් ගොඩනැගිලි ඇතුළත් හෙක්ටයාර් 0.328ක්, විශාල ඉඩම 2024 දෙසැම්බර් 31 දින වන විටත්, තක්සේරු කර මූල්‍ය වත්කම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු මුද්‍රණ අංශය වෙත 2018 වර්ෂයේ දී මිලදීගෙන තිබුණු රු. 546,264,452ක් වටිනා Wide Web Digital මුද්‍රණ යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේදීත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුලත් කර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුව සතුව වාහන 24 ක් පැවති නමුත්, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙහි රු. 37,220,000 ක වටිනා වාහන 15 ක් පමණක් ඇතුළත් කර තිබුණු අතර වාහන 09 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිගාස් පරිගණක වැඩසටහනේ සඳහන් මූල්‍ය නොවන වත්කම්වල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණු රු.275,174,790 ක නිමකල වැඩවල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	ස්ථාවර වත්කම් ලේඛනය	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය	යාවත්කාලීන කර නොතිබුණි.
(ආ)	වාහන ලොග් සටහන් පොත්	මුදල් රෙගුලාසි 1645 (අ)	යාවත්කාලීන කර නොතිබුණි.
(ඇ)	හානි පාඩු ලේඛණය	මුදල් රෙගුලාසි 110	පවත්වා නොතිබුණි.
(ඈ)	ගෙවීම් ලේඛන	මුදල් රෙගුලාසි 138	නිලධාරියෙකුට ගෙවීම් සිදු කිරීමේදී එකම දිනක් තුල කාර්යයන් කිහිපයකට ගෙවීම් සිදු නොකෙරෙන පරිදි ලේඛන සකස් කර පවත්වා ගැනීමට ඒ ඒ අංශ හා ගිණුම් අංශය කටයුතු කර නොතිබුණි.
(ඉ)	වාහන ලේඛනය	මුදල් රෙගුලාසි 1647 (ඉ)	මුදල් රෙගුලාසි වල දක්වා ඇති නියමයන් අනුව වාහන ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොනිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොනිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
154 (6) වාර්තාවේ 1.6.1 (අ) (i)	ඉඩම තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කල යුතුය.	1.6.3 (ආ)
154 (6) වාර්තාවේ 3.3	ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය.	1.6.3 (අ)

2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) හා (2) වගන්ති ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යෑමට අවශ්‍ය ඩෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

(ආ) විභාග දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී පාසල් විභාග පැවැත්වීම සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි පැවති දුර්වලතා හේතුවෙන් පවත්වා නිබුණු විභාග 03 කින් එක් විභාගයක් වූ 5 වසර ශිෂ්‍යත්ව විභාගයට පොදුවේ ලකුණු 7 ½ ක් (හතගමාරක්) ලබාදීමට සිදු වී නිබුණු බව විගණනයට නිරීක්ෂණය වූයෙන් ඒ සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතු බවට වූ විගණන නිරීක්ෂණය සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ලෙස "5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පොදු ලකුණු ලබාදීමට හේතු වූයේ පාසල් විභාග පැවැත්වීම සම්බන්ධව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයෙහි පැවති දුර්වලතා හේතුවෙන් නොව ඒ සඳහා සම්බන්ධ කරගත් සම්පත්දායක පුද්ගලයෙකුගේ පුද්ගල බද්ධ සිදුවීමක් හේතුවෙනි." යනුවෙන් දක්වා නිබුණි. ඒ අනුව විභාග පැවැත්වීමට සම්පත්දායකයින් තෝරා ගැනීම, ඔවුන්ට මාර්ගෝපදේශ ගදුන්වාදීම ඇතුළු විභාග ආශ්‍රිත

කාර්යයන්වලට අදාල සමස්ථ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ප්‍රමාණවත් පරිදි පවත්වා ගත යුතු බව විගණනයට නිරීක්ෂණය විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉවතලන කඩදාසි විකිණීමෙන් 2020 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දක්වා දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු රු.21,387,554 ක්, 2024 දෙසැම්බර් 31 දින වන විටත් වාලවිවේන කඩදාසි කමිහලෙන් අය කරගෙන නොතිබුණි.

(ආ) විභාග හා අනෙකුත් ගාස්තු වෙනුවෙන් තැපැල් දෙපාර්මේන්තුවෙන් ලැබිය යුතු රු. 80,150 ක් වූ ආදායම වසර දෙකකට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ඇ) 2024 වර්ෂයේ ආයතන විභාග පැවැත්වීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන 03 කින් අයවිය යුතු රු. 3,617,601 ක් 2025 අප්‍රේල් 22 දින වන විටත් හිඟව පැවතුණි.

3.2 වියදම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 26 ක් සඳහා වෙන්කර තිබුණු රු. 10,312,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 3,659,824,352 ක් ඉතිරි ව පැවතුණු අතර ඉන් වැය විෂයයන් 02ක ඉතිරිය සියයට 100 ක් ද වැය විෂයයන් 07 ක ඉතිරිය සියයට 50ත් සියයට 92ත් අතර පරාසයක ද වැය විෂයයන් 17 ක ඉතිරිය සියයට 10ත් සියයට 50 ත් අතර පරාසයක ද විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 33 ක් ඉතිරිවීම ප්‍රායෝගික තත්ත්වයෙන් බැහැරව සිදුකරන ලද සැලසුම් හා දුර්වල ඇස්තමේන්තුකරණය මූලිකවම හේතු වී තිබුණු බව නිරීක්ෂණය කෙරේ.

(ආ) ආයතනික විභාග පැවැත්වීම

(i) විභාග දෙපාර්තතමේන්තුව විසින් රාජ්‍ය ආයතනවලට අදාල ආයතනික විභාග පැවැත්වීම වෙනුවෙන් 212-2-2-2-1409(107,108) යන වැය විෂය යටතේ කාර්ය මණ්ඩලයට ගෙවීම් සඳහා (විභාග කාර්ය මණ්ඩල හා දෙපාර්තමේන්තු කාර්යමණ්ඩල ලෙස) වර්ෂයකට රු.920,000,000 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබුණි. විභාග දෙපාර්තමේන්තුව ආයතනික විභාග පැවැත්වීම කෙරෙහි පවතින ඉහිරිතාවය තක්සේරු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට විභාග 238 ක් සඳහා ප්‍රතිපාදන වෙන් කරගෙන ආයතනික විභාග 86 ක් පැවැත්වීම හේතුවෙන් රු. 603,057,495 ක අධි ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණි.

(ii) විභාග දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී පැවැත්වීමට නියමිතව තිබුණු ආයතනික විභාග සඳහා 212-2-2-2-1409(107,108) වැය විෂය යටතේ රු.920,000,000 ක ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණි. එසේ වෙන්කරවාගෙන තිබියදීත් සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබුණු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ආයතනික විභාග 86 ක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලයකින් තොරව රු. 147,402,224 ක මුදලක් ලබාගැනීමට කටයුතු කර තිබුණි.

(iii) තවද සමාලෝචිත වර්ෂයේදී ආයතනික විභාග 212-2-2-2-1409 (107,108) වැය විෂයයේ සත්‍ය වියදම රු.311,942,505 ක් වූ අතර රු. 603,057,495 ක ප්‍රතිපාදන ඉතිරිවීම් නිරීක්ෂණය විය. එම ප්‍රතිපාදන ඉතිරිවීම්වලට හේතු ලෙස දක්වා තිබුණු " ආයතනික විභාග සඳහා වෙනත් ආයතනවලින් වියදම් දැරීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීම" යන්න ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු ලෙස විගණනයේදී පිළිගත නොහැකි වූ අතර ඇස්තමේන්තුකිරීමේ දුර්වලතා සහ අධිකාරී බලයකින් තොරව රජයේ ආයතන වලින් මුදල් ලබා ගැනීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී තිබුණි.

(iv) අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ආයතනික විභාග පැවැත්වීම සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන වෙන්කරවාගෙන තිබියදී තව දුරටත් විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ ආයතනික විභාගයේ වියදම චෙක්පත් මගින් ඒ ඒ ආයතන මගින් අධිකාරීබලයක් නොතිබියදී ලබාගැනීමට කටයුතු කිරීම හේතුවෙන් එකම කාරණාවට ශීර්ෂ 2 කින් ප්‍රතිපාදන වෙන්කර ගන්නා බව විගණනයට නිරීක්ෂණය විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී එපරිදි ආයතනික විභාග 238 ක් පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව රු.920,000,000ක් වෙන් කරවාගෙන තිබියදී අනෙකුත් ආයතන විසින්ද රු. 147,402,224 ක් ආයතනික විභාග සඳහා විභාග දෙපාර්තමේන්තුවට ගෙවා තිබීමෙන් එකම කාරණාවට ශීර්ෂ 2 කින් රු. 147,402,224 ක් බැගින් රු. 294,804,448 ක් ප්‍රතිපාදන වෙන්කරවාගෙන තිබීමෙන් රු. 147,402,224 ක් වැඩියෙන් ප්‍රතිපාදන වෙන්කරවාගෙන තිබුණි. එය රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අහිතකර බව නිරීක්ෂණය විය.

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ බැඳීම් හා බැරකම් හඳුනාගත යුතු වුවත්, 212-2-2-0-1402 යන තැපැල් හා සන්නිවේදනය වැය විෂයෙහි ඉතිරිවීම් ඉක්මවා රු. 1,983,049 ක බැරකම්වලට බැඳී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
XXIV පර්වඡේදයේ 4.4 වගන්තිය	දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටිය දී වසර දෙකකට පෙර මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 211,323 ක ආපදා ණය ශේෂයක් ආයතන සංග්‍රහය අනුව 2024 දෙසැම්බර් 31 දින වන විටත් අය කරගෙන නොනිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 103(1)	2022 හා 2024 වර්ෂවලදී සිදුවී නිබුණු වාහන අනතුරු 02 ක් සම්බන්ධව පොලිසියට වාර්තා කර නොනිබුණු අතර රක්ෂණ වන්දි ලබා ගැනීමටද කටයුතු කර නොනිබුණි.
(ii) මුදල් රෙගුලාසි 104 (3)	නැතිවීම් හානිවීම් සම්බන්ධ පරිපූර්ණ වාර්තාවක් දින 07 ක් ඇතුලත ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත්, ප්‍රාරම්භක වාර්තාවක් පිළියෙල කර පිටපතක් විගණකාධිපති වෙතද ඉදිරිපත් කල යුතු වුවත්, වාහන අනතුරු 02 ක් සම්බන්ධව එසේ කටයුතු කර නොනිබුණි.
(iii) මුදල් රෙගුලාසි 104 (4)	අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් අතුලත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද අංක 43-4833 දරන ලොරි රථයේ අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොනිබුණු අතර වගකිවයුත්තන් හඳුනා ගැනීමටද කටයුතු කර නොනිබුණි.
(iv) මුදල් රෙගුලාසි 104	පාසල් විභාග සංවිධාන ශාඛාව වෙත ගබඩාවෙන් නිකුත් කරන ලද හඬ පටිගත කිරීමේ යන්ත්‍ර 07 ක් සහ ඇගයීම් කටයුතු සඳහා භාරදී නිබුණු හඬ පටිගත කිරීමේ යන්ත්‍ර 16 ක් වශයෙන් වූ හඬපටිගත කිරීමේ යන්ත්‍ර 23 ක් අස්ථානගත වී නිබුණ ද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අලාභය අයකරගෙන නොනිබුණි.

(v)	මුදල් රෙගුලාසි 1646	දෙපාර්තමේන්තුවේ සංචිත වාහන 17 කට අදාලව 2024 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
(අ)	2017 දෙසැම්බර් 21 දිනැති හා අංක 02/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 වගන්තිය	ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත, තම ආයතනය නමින් ලියාපදිංචි කරගැනීමට හෝ නැවත පවරාදීමට කටයුතු කළ යුතු බව පෙන්වා දී තිබුණ ද, අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් KD-6386 ජීප් රථයේ අයිතිය පවරා ගැනීමට හෝ නැවත පවරාදීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති හා අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය	සමාලෝචිත වර්ෂයේදී වාහන 21ක ඉන්ධන දහනය පරීක්ෂාව සිදුකල බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.
(ඉ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 113(6)(ආ)	(i) සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු. 226,738 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර මෙම ණය ශේෂ අවුරුදු 03 ත් 25 ත් අතර කාල පරාසයකට අයත්ව තිබුණි.
		(ii) 2013 වර්ෂයේ වැඩ නහනම් කරන ලද නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 113,320 ක ආපදා ණය ශේෂය වසර 12 ක කාලයක සිට අය කරගෙන නොතිබුණි.

4.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 වන ඡේදය අනුව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය 2024 අප්‍රේල් 05 දින ලබාගෙන තිබුණි.

(ආ) 2024 වර්ෂයට අදාලව යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12 (ආ) ඡේදයේ දැක්වෙන ආකෘතියට අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොනිබුණු අතර ඒ අනුව 2024 වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව යතත් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan) ක්‍රියාත්මක කාලරාමුව (Time Line) සහ එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම් / ප්‍රතිඵල යනාදිය ක්‍රියාකාරී සැලැස්මෙහි අඩංගු වී නොනිබුණි.

4.3 ප්‍රසම්පාදනයන්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2020 අගෝස්තු 28 දිනැති හා 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කර අනුමැතිය ලබාගත යුතු වුවද 2024 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගැනීම සඳහා 2024 මාර්තු 07 දින ඉදිරිපත් කර නිබුණි.

(ආ) 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද, 1990 වර්ෂයට පෙර වර්ෂවල විභාග ප්‍රතිඵල ලේඛන මහජනතාව වෙත අවශ්‍ය අවස්ථාවන්හි දී නිකුත් කිරීමට පහසු වන ආකාරයට එම ප්‍රතිඵල ලේඛන පරිලෝකනය (Scan) කර තබාගත හැකි ආකාරයේ මෘදුකාංගයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය 2024 අගෝස්තු 24 දින නිම කිරීමට සැලසුම් කර නිබුණ ද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතිය නිමකර නොනිබුණු අතර වෙන්කරන ලද රු. 15,000,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී නිබුණි.

4.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

4.4.1 <u>වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය භාවිත නොකිරීම</u>

(අ) දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේ පවත්වන ලද විභාග සඳහා රහස්‍ය මුද්‍රණාලයේ මුද්‍රණ යන්ත්‍ර 05 ක් භාවිතා කරමින් ප්‍රශ්නපත්‍ර 3,250,715 ක් මුද්‍රණය කර නිබුණ අතර 2018 වර්ෂයේ දී රු. 546,264,452 ක වියදමක් දරා මිලදීගෙන නිබුණු වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය උපයෝගී කරගෙන 2024 වර්ෂයේ දී ප්‍රශ්නපත්‍ර 1,721,753 ක් මුද්‍රණය කර නිබුණි. එම ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ රහස්‍ය මුද්‍රණාලයේ මුද්‍රණ යන්ත්‍ර 05 මගින් මුද්‍රණය කරන ලද සමස්ථ ප්‍රශ්නපත්‍ර ප්‍රමාණයෙන් සියයට 34 කි. ඒ අනුව පිරිවැය රු. 546,264,452 ක් වූ යන්ත්‍රය ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) තවද මෙම ඩිජිටල් යන්ත්‍රය අලුත්වැඩියාව හා සේවා ගිවිසුම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී පිළිවෙලින් රු.12,488,128 ක් හා රු. 1,895,080 ක මුදලක් ද වැයකර තිබුණු බව නිරීක්ෂණය වූ අතර මෙම යන්ත්‍රය මිලදීගත් අරමුණට මුළුමනින්ම උපයෝජනය නොවීම හේතුවෙන් ඒ ඒ අවශ්‍යතාවය පරිදි ප්‍රශ්නපත්‍ර මුද්‍රණය සඳහා පමණක් භාවිතා කර තිබුණු අතර ඇසුරුම් කිරීමේ පහසුකම යාන්ත්‍රිකව සිදුකර නොතිබුණි. ඒ අනුව ප්‍රශ්නපත්‍ර ඇසුරුම් කිරීමට අමතර ගෙවීම් කිරීමටද සිදුවී තිබුණි.

(ඇ) ප්‍රශ්නපත්‍රවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා රු. 8,428,637 ක් වටිනා උක්ත යන්ත්‍රයෙහි ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයේ wrapping Solution කොටසක් 2018 වර්ෂයේ දී මිලදී ගෙන තිබුණ ද දෙපාර්තමේන්තුව දැනට භාවිතා කරන රහස්‍ය ලේඛන ඇසුරුම් ක්‍රියාවලිය සමඟ එම කොටස නොගැලපීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දින දක්වාම එම යන්ත්‍ර කොටස නිශ්කාර්යව පැවතුණි.

4.5 රජයේ නිලධාරීන් ඇප තැබීම

2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 වගන්තිය අනුව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වෙනි අධිකාරියේ 4 වගන්තියට අනුව ඇප තැබිය යුතු නිලධාරීන්, ඇප තැබිය යුතු ප්‍රමාණය හා ඇප තැබිය යුතු ක්‍රමය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට කළ හැකි බව දක්වා තිබුණද 2024 දෙසැම්බර් 31 දින දක්වාම දෙපාර්තමේන්තුවේ වගකීම් දරන කිසිදු නිලධාරියෙකු ඇප තැබීමක් සිදුකර නොතිබුණි.

4.6 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

මුදල් රෙගුලාසි 128(1) (ඇ) ප්‍රකාරව ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වාගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය කලින් කල සෝදිසි කරන බවට වග බලාගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීමක් වන අතර අභ්‍යන්තර පාලන ක්‍රමයේ දුර්වලතා හේතුවෙන් විගණනයේ නියැදි පරීක්ෂාව අනුව විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දීමනා ගෙවීමෙදී එකම දින එකම කාලය තුල විභාග රාජකාරි දෙකක් සඳහා දීමනා සහ අතිකාල ලෙස රු.11,514 ක් ගිණුම් අංශය විසින් වැඩිපුර ගෙවා තිබුණු අතර නිලධාරීන්ද චේතනාන්විතව වැඩිපුර මුදල් ඉල්ලුම් කර ලබාගැනීමට කටයුතු කර තිබුණි. වැඩිපුර ගෙවීම් නිර්දේශ කරන ලද ගිණුම් අංශයද ඇතුළු ඒ ඒ අංශ ප්‍රධානීන් සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසීම ඇතුළුව ඉදිරි කටයුතු හා ඒ ආශ්‍රිත සමස්ථ ගෙවීම් පරීක්ෂා කර සමස්ථ වැඩිපුර ගෙවීම් හඳුනා ගනිමින් එසේ වැඩිපුර ගෙවීම් සිදු නොවීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳවත් විගණනයට වාර්තා කළ යුතු බව ද නිරීක්ෂණය කෙරේ.

4.7 කළමනාකරණ දුර්වලතා

(අ) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නිරත වන නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම්, උසස් කිරීම් හා විශ්‍රාම ගැන්වීම් සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) විභාගයන්හි ප්‍රතිඵල සනාථ කරගැනීම් සඳහා රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කර තිබුණු ඉල්ලීම්වලින් 7,958 ක් 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රතිඵල සනාථ කිරීමකින් තොරව ඉතිරිව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හා ඊ සේවාවන්ට අදාළ සේවා ගිවිසුම 2021 නොවැම්බර් 30 දින වන විට අවසන් වී තිබුණ ද නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට 2025 අප්‍රේල් 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2024 වර්ෂයේ මාර්තු, අප්‍රේල්, මැයි මාසවල ආයතන විභාග රහස්‍ය ලේඛන ප්‍රවාහන කටයුතු සඳහා සහභාගී වී තිබුණු නිලධාරීන් 80 දෙනෙකු විසින් 2025 ජනවාරි වන විටත් රජකාරි නිවාඩු අනුමත කරගෙන නොතිබුණි.

(ඈ) වියත්පුර නිල නිවාස මිලදීගැනීම

විභාග පවත්වන කාලසීමාවන් තුළ දී පාසල් විභාග සංවිධාන, රහස්‍ය (පාසල් විභාග), රහස්‍ය (ආයතනික විභාග), ඇගයීම් (පාසල් විභාග) යන ශාඛාවන්වල සේවයේ නිරත මාණ්ඩලික නිලධාරීන් මධ්‍යම රාත්‍රිය දක්වා සේවයේ යෙදීමට සිදු වී තිබීම හේතුවෙන් ඔවුන්ට දෙපාර්තමේන්තුව අසල නිල නිවාස ලබාදීමේ අවශ්‍යතාවයක් පවතින බව පෙන්වා දී 2020 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන රු. 34,700,936 ක මුදලක් වැයකර ලබා ගන්නා ලද නිල නිවාස 03 ක් 2023 අගෝස්තු 29 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කළ සංදේශයෙහි සඳහන් වන කරුණු අනුව නිලධාරීන් රැසකගේ නවාතැන් ගැටලු විසඳාගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව සඳහන් කර තිබුණද උක්ත නිල නිවාස එක් අයෙකුට නිවස බැගින් නිලධාරීන් තිදෙනෙකුට පමණක් ලබාදීමට දෙපාර්තමේන්තුව තීරණය කර තිබීම නිසා අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කල පරිදි නිලධාරීන් බොහෝ දෙනෙකු මුහුණදෙන නවාතැන් ගැටලුවට විසඳුමක් ලැබී නොතිබුණි.

(ii) වියත්පුර මහල් නිවාස සංකීර්ණයේ නිල නිවාස 03 ක් 2023 අගෝස්තු 29 දෙපාර්තමේන්තුව වෙත බාර දී තිබුණද එම නිල නිවාස 03 න් දෙකක් භාර දුන් දින සිට 2025 ජනවාරි 01 දක්වා මාස 16 ක් ද අනෙක් නිල නිවාසය විගණිත දින වූ 2025 අප්‍රේල් 08 දක්වා මාස 19 ක් ද නිෂ්කාර්යව පැවතී තිබුණි.

(iii) නිවාස ලබාගැනීමට සුදුසුකම් ලත් නිලධාරීන් හඳුනාගැනීම, නිවාස භාරදීම, නිවාස නැවත භාරගැනීමට, ගිවිසුම් ගතවීමට, නඩත්තු කටයුතු සඳහා යනාදී වශයෙන් අභ්‍යන්තර පාලනයන් සහිත මාර්ගෝපදේශයක් පිළියෙල කර රු. 34,700,936 ක් වැයකර මිලදීගත් නිවාස 03 අරමුණුගතව යෙදවීමට හැකි පරිදි සැලසුම්ගත ක්‍රමවේදයක් සකස් කිරීමට ගණන්දීමේ නිලධාරී විසින් කටයුතු කර නොතිබුණි.

(iv) නිලධාරීන් සමූහයකගේ නිවාස අවශ්‍යතාවය වියදීමට මිලදීගන්නා ලද නිවාස 03 න් 02 ක් 2025 ජනවාරි 01 දින තනි නිවාස ලෙස නිලධාරීන් දෙදෙනෙකුට පමණක් ලබාදීමට කටයුතු කර තිබුණි.

6 යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

(අ) අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සිදුකරන විගණන පරීක්ෂණවලින් අනාවරණය කරගත් නිරීක්ෂණය, නිගමනය හා නිර්දේශ ඇතුලත් අභ්‍යන්තර විගණන වාර්තා ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2024 වර්ෂය තුලදී සැලසුම් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සංඛ්‍යාව 15 ක් වුවත් අභ්‍යන්තර විගණන වාර්තා 05 ක් පමණක් නිකුත් කර ඇති අතර 2024 ජුනි මාසයෙන් පසු විගණන වාර්තා කිසිවක් නිකුත් කර නොනිබුණි.

(ආ) මු.රෙ.133 (1) ප්‍රකාරව අභ්‍යන්තර විගණක විසින් දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගි වී එම කටයුතුවල සහ වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර චෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම සිදු කළ යුතු බව දක්වා නිබුණද 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී ආයතනයේ වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට හා අභ්‍යන්තර පාලන ක්‍රම පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් කාලයක් වැයකර නොතිබෙන බව අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලද විගණන වාර්තා අනුව නිරීක්ෂණය විය.

6.2 විගණන හා කළමනාකරණ කමිටුව

2019 ජනවාරි 12 දිනැති හා අංක DMA/01 – 2019 දරණ කළමනාකරණ විගණන වක්‍රලේඛයේ 5.3 ඡේදය අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක්, එනම් වර්ෂයකට හතරක් වන පරිදි පැවැත්විය යුතු වුවද 2024 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 3 ක් පමණක් පවත්වා තිබුණි.

අයි.ඩී.අයි. ප්‍රියදර්ශනී

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති (EDU)

නියෝජ්‍ය විගණකාධිපති වෙනුවට

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	89% - 75%	74% - 50%	49% - 0%
ජාතික මට්ටමේ පාසල් විභාග සංවිධානය හා පැවැත්වීම {5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය, අ.පොෂ. (සා.පෙළ), අ.පොෂ. (උ.පෙළ)}	100%			
ආයතනික විභාග පැවැත්වීම	100% *			
සහතිකපත්‍ර නිකුත් කිරීම	100%			
නව බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම	100%			

* විභාග පැවැත්වීම සඳහා බාහිර ආයතනවලින් 50% කට වඩා ගෙවීම් කරන ලද සෑම විභාගයක්ම පවත්වා ඇත. ඊට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය හා විභාග දෙපාර්තමේන්තුවට අදාළ විභාග ද පවත්වා ඇත.

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
SDG Goal 4 ගුණාත්මක අධ්‍යාපනය	5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පොස. (උ.පෙළ), අ.පොස. (සා.පෙළ) සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය යන විභාග පොදු කාලසටහනක් යටතේ දිවයින පුරා එකම වේලාවක පැවැත්වීම සහ ඒ සඳහා සියලු අපේක්ෂකයන්ට සමාන ප්‍රවේශ අවස්ථා ලබාදීම	එම විභාග සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව			✓
	විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ ආබාධ සහ දුර්වලතා සම්මුඛ පරීක්ෂණයක් මගින් හඳුනාගෙන ඔවුන්ට විභාගයට පෙනී සිටීමේ දී සහන ලබා දීම උදා :- 1. ඔවුන් භාවිතා කරන හුරුපුරුදු උපකරණ, විශේෂ රෝද පුටු, විභාග කාර්යමණ්ඩලය අවශ්‍යතාව අනුව යොදවා ගැනීමට ඉඩ දීම 2. වැඩිපුර කාලය ලබාදීම 3. විශේෂිත විභාග පරිපාලන ක්‍රම	සහන ලබාගත් අයදුම්කරුවන් සංඛ්‍යාව			✓
	ගැහැණු හෝ පිරිමි, ආගම් අනුව, සංස්කෘතීන් අනුව ප්‍රශ්න පත්‍රයක අයිතම නැඹුරු වීම අවම කිරීම	ප්‍රශ්න පත්‍රවල සෑමට සාධාරණභාවය			✓

ඉලක්කය/ අරමුණ	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
SDG Goal 4 ගුණාත්මක අධ්‍යාපනය	දත්ත විශ්ලේෂණ මගින් විභාග අපේක්ෂකයන් දුර්වලතා දක්වන ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම සහ ගුරු උපදේශකවරුන් / විෂය නිලධාරීන්ට තම කොට්ඨාසවල විෂය සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීමට උපකාර කිරීම	සෑම ජාතික විභාගයකම ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු දත්ත විශ්ලේෂණය කොට වාර්තා වෙබ් අඩවියෙහි පළ කිරීම			✓
	අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගවල තෝරාගත් විෂයයන් සඳහා ශිෂ්‍ය සාධන දත්ත සහ සාර්ථකව ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු ඇතුළත් ඇගයීම් වාර්තා දිවයිනේ අදාළ පාසල් සඳහා ලබාදීමෙන් සියලු සිසුන්ට ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම	අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාගවල ප්‍රධාන විෂයන්වලට අදාළව නිමවන ලද ඇගයීම් වාර්තා		✓	
	ප්‍රශ්න පත්‍රවල අයිතම විශ්ලේෂණය සහ සිසුන්ගේ සාධනය පිළිබඳ තොරතුරු ඇතුළත් සියලුම විෂයන්ගේ සමපාලක පරීක්ෂකවරුන් සඳහා ලබාදෙන පොත් හරහා විභාග අපේක්ෂක සෑමට සාධාරණ ප්‍රශ්න පත්‍රයක් ලබාදීමට පහසුකම් සැලසීම	සෑම විෂයකම තොරතුරු ඇතුළත් CCM පොත්			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

- 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2024, අ.පො.ස. (උ.පෙළ) 2023 (2024), අ.පො.ස. (සා.පෙළ) 2023 (2024) සහ අ.පො.ස. (උ.පෙළ) 2024 යන විභාග රහස්‍යභාවය උපරිම ආරක්ෂා කරමින්, පොදු කාලසටහනක් යටතේ දිවයින පුරා එකම වේලාවක පැවැත්වූ අතර ඒ සඳහා සියලු අපේක්ෂකයන්ට සමාන ප්‍රවේශ අවස්ථා ලබා දෙන ලදී.

- 2024 වර්ෂයේ දී පැවැත්වූ සියලුම ජාතික මට්ටමේ විභාග පැවැත්වීමට පෙර විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ ආබාධ සහ දුර්වලතා සම්මුඛ පරීක්ෂණයක් මගින් හඳුනාගෙන ඔවුන්ට විභාගයට පෙනී සිටීමේ දී අවශ්‍ය සහන ලබා දෙන ලදී.

- ඇගයීම් වාර්තා සියලු පාසල්වලට ලබාදීම හා වෙබ් අඩවියට ඇතුළත් කිරීම මගින් දුෂ්කර ප්‍රදේශවල සිට විභාගයට ඉදිරිපත් වන සිසුන්ට ද විභාගය පිළිබඳ තොරතුරු හා උපදෙස් සන්නිවේදනය කිරීම, ගුරුවරුන්ට නිසි උපදෙස් ඒ හරහා ලබාදීම හා අධ්‍යාපන සංවර්ධනය පිළිබඳ කටයුතු කරන නිලධාරීන්ට සිසුන්ගේ දුර්වලතා පිළිබඳ තක්සේරුවක් ලබාදීම.

- එක් එක් ජාතික විභාග ආසන්නයේ දී විභාග අපේක්ෂකයන්, ගුරුවරුන්, දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා රූපවාහිනී හා ගුවන්විදුලි මාධ්‍ය භාවිතයෙන් පැවැත්වෙන දැනුවත් කිරීමේ සාකච්ඡා.

අභියෝග

- විභාගය මූලික කරගත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හේතුවෙන් ඉගෙනුම සඳහා තක්සේරුකරණ ක්‍රියාවලිය පන්තිකාමර තුළ සිදු නොවීම තුළ නිපුණතා රහිත සිසුන් පාසලෙන් පිටවීම අභියෝගයක් වී ඇත.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	90	73	17
තෘතීයික	26	14	12
ද්විතියික	488	362	126
ප්‍රාථමික	209	ස්ථිර - 114 අනියම් - 60	95

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

උක්ත 6.1 හි සඳහන් පරිදි මානව සම්පත් හිඟයක් පැවතියද, දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට බලපෑමක් නොවන අයුරින් දැනට පවතින මානව සම්පත දෙපාර්තමේන්තු රාජකාරි සඳහා යොදවා ගැනීමට දෙපාර්තමේන්තු පරිපාලනය සමත් ව ඇත. එමෙන්ම, දැනට දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීම තුලින් පවත්නා තත්ත්වයට වඩා උසස් වූ කාර්ය සාධන මට්ටමක් පෙන්නුම් කිරීමට හැකි වනු ඇති බවට විශ්වාස කෙරේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා මුද්‍රණ සේවයට අයත් නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා මුදල් රෙගුලාසි, කාර්යාල ක්‍රම, ප්‍රසම්පාදනය, භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය සහ වෙනස්වීම් කළමනාකරණ උපක්‍රම (Change Management Strategies) පිළිබඳ පුහුණු වැඩමුළුව	90	දින 03	179,980	-	දේශීය	නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරි ඉටු කිරීමේ දී නියමිත නීති රෙගුලාසිවලට අනුව කටයුතු කිරීමට අවශ්‍ය දැනුම, රාජකාරි කටයුතු නිවැරදිව, ක්‍රමානුකූලව, කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය දැනුම, ලිපිගොනු නිවැරදිව පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම හා නිලධාරීන්ගේ පෞද්ගලික සංවර්ධනයට අවශ්‍ය දැනුම
දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ කළමනාකරණ කුසලතා සංවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අනුබද්ධ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) මගින් මෙහෙය වූ කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන	70	දින 01	492,040	-	දේශීය	මාණ්ඩලික නිලධාරීන් සඳහා නිවැරදි තීරණ ගැනීමට අවශ්‍ය දැනුම, සේවක කළමනාකරණයට අවශ්‍ය දැනුම ඇතුළු නිලධාරීන්ගේ කළමනාකරණ කුසලතා වර්ධනය කර ගැනීමට අවශ්‍ය දැනුම
Metropolitan Campus KDU ආයතනය මගින් මෙහෙය වූ Payroll System සම්බන්ධ පුහුණු වැඩමුළුව	01	දින 03	18,000	-	දේශීය	Payroll පද්ධතිය මගින් මනාව රාජකාරි ඉටු කිරීම පිළිබඳ නිසි අවබෝධය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය මගින් මෙහෙයවනු ලැබූ ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන	01	දින 20	60,000	-	දේශීය	ප්‍රවාහන අංශයේ රාජකාරි නියමිත නීති රෙගුලාසිවලට අනුව ඉටු කිරීමට අවශ්‍ය දැනුම, නිසි පරිදි වාර්තා පවත්වා ගැනීමට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික පුහුණුව
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (SLIIT) මගින් මෙහෙයවනු ලබන Cyber Seurity and Digital Forensics පාඨමාලාව	01	පැය 48	59,450	-	දේශීය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන්ගේ තනතුරට අදාළ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම
ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (SLIIT) මගින් මෙහෙයවනු ලබන Web Development පාඨමාලාව	01	පැය 68	35,875	-	දේශීය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන්ගේ තනතුරට අදාළ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම
රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සඳහා වන පැය 150 දෙමළ භාෂා පාඨමාලාව (පාඨමාලාව 2024 වර්ෂයේ අවසන් භාගයේ දී ආරම්භ කළ අතර, 2025 වර්ෂයේ දී නිම වීමට නියමිතයි)	50	පැය 150	46,900	-	දේශීය	රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී අවශ්‍ය වන දෙමළ භාෂාව පිළිබඳ මූලික දැනුම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පැවරීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	පිළිතුරු ප්‍රමාද වීම් ද ඇත	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	සෑම වාර්තාවකටම මාසයක් තුළ පිළිතුරු ලැබී නොමැත	සෑම වාර්තාවකටම වාර්තාව ලැබුණු දින සිට දින 14 ක් තුළ පිළිතුරු සැපයීම කළ යුතු බව දන්වා යවා ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇත	සිව්වන කාර්තුවේදී ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු නොසිටීම

				හේතුවෙන් කමිටු රැස්වීම පැවැත්වීමට නොහැකි විය.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		

16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	පුහුණු අවශ්‍යතාවල පවතින ප්‍රමුඛතාව, පුහුණු අවශ්‍යතා සඳහා ඉදිරිපත් කරන ඉල්ලීම් හා පැවති සීමිත ප්‍රතිපාදන මත පදනම්ව සමස්ත කාර්ය මණ්ඩලයේ බොහෝ තනතුරු ආවරණය වන පරිදි 2024 වර්ෂයේ දී පුහුණු අවස්ථා ලබා දෙන ලදී. (මාණ්ඩලික නිලධාරී, සංවර්ධන නිලධාරී කළමනාකරණ සේවා නිලධාරි, මුද්‍රණ	අනෙකුත් ඉතිරිව පවතින පුහුණු අවශ්‍යතා සැලකිල්ලට ගෙන 2025 වර්ෂයේ සහ ඉදිරි වර්ෂවල දී තවත් නිලධාරීන් සඳහා පුහුණු වීම් ලබා දීමට සැලසුම් කර ඇත.

			සේවයේ නිලධාරීන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර) තවද, මෙම දෙපාර්තමේන්තුව වර්ෂය පුරාම ජාතික මට්ටමේ විභාග හා ආයතනික විභාග රාශියක් පවත්වනු ලබයි. එබැවින් වර්ෂය පුරාම නිලධාරීන් අධික ලෙස කාර්යබහුල වේ. එවැනි තත්ත්වයක් තුළ සෑම නිලධාරියෙකු සඳහාම අවම පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා ලබාදීමට ප්‍රායෝගිකව ඉඩ සැලසෙන්නේ නැත.	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		